# ලංකා බැංකුව

ලොව ප්‍රමුඛ පෙළේ බැංකු 1000 අතරට මෙන්ම ආසියා පැසිෆික් කලාපයේ ප්‍රමුඛ පෙළේ දැවැන්ත බැංකු 500 අතරට ශ්‍රේණිගතව ඇති සහ ශ්‍රී ලංකාව තුළ රජයට අයත් අංක 1 අග්‍රගණ්‍ය බැංකුව වන ලංකා බැංකුව පහත සඳහන් තනතුරු සඳහා අදාළ සුදුසුකම් ඇති උද්යෝගිමත් සහ ප්‍රතිඵල හඹායත තරුණ තරුණියන්ගෙන් ලංකා බැංකුවේ තාක්ෂණ අංශය සඳහා අයදුම්පත් කැඳවනු ලැබේ.

## පද්ධති විශ්ලේෂක / පරිගණක ක්‍රම සම්පාදක

### යෝග්‍යතා නිර්ණායක

### 01. සුදුසුකම් හා පළපුරුද්ද

ශ්‍රී ලංකා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන දේශීය හෝ විදේශීය විශ්වවිද්‍යාලයකින් ලබාගත් පරිගණක විද්‍යාව හෝ තොරතුරු තාක්‍ෂණය හෝ තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය හෝ මෘදුකාංග ඉංජිනේරු විද්‍යාව පිළිබඳව පළමුවන හෝ දෙවන පන්තියේ ඉහළ සාමාර්ථයක් සහිත උපාධියක් තිබීම

හෝ

ශ්‍රී ලංකා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන දේශීය හෝ විදේශීය විශ්වවිද්‍යාලයකින් ලබාගත් පරිගණක විද්‍යාව හෝ තොරතුරු තාක්ෂණය හෝ තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය හෝ මෘදුකාංග ඉංජිනේරු විද්‍යාව පිළිබඳ උපාධියක් සමග මෘදුකාංග සංවර්ධනය / තත්ත්ව සහතික කිරීම / දත්ත සමුදාය පරිපාලනය / තොරතුරු ආරක්ෂණය පිළිබඳව අවම වශයෙන් වසරක පළපුරුද්දක් තිබීම.

### 02. වෙනත් සුදුසුකම්

- තොරතුරු පද්ධති ආරක්‍ෂණය / දත්ත සමුදාය පරිපාලනය සහ මෘදුකාංග තත්ත්ව සහතික කිරීම පිළිබඳව වෘත්තීයමය සුදුසුකම් තිබීම අමතර සුදුසුකමක් වනු ඇත.
- මෘදුකාංග තත්ත්ව සහතික කිරීම / දත්ත සමුදාය පරිපාලනය / තොරතුරු ආරක්ෂණය හෝ Enterprise / Advanced JAVA, J2EE, XML, RPG, ILE, CLLE, Dojo, Spring MVC, Web Sphere, C#, .Net, HTML උපයෝගීකර ගනිමින් මෘදුකාංග සංවර්ධනය කිරීම පිළිබඳ පළපුරුද්ද තිබීම අමතර සුදුසුකමක් වනු ඇත.
- ස්වයං අභිප්‍රේරිත බව සහ ප්‍රතිඵල කරා දිශාභිමුඛ බව
- ගැටලු විසඳීමේ විශිෂ්ට කුසලතා සමග ඉහළ තව්‍යකරණ හැකියාවක් තිබීම.

### 03. වයස

අයදුම්පත් භාරගන්නා අවසන් දිනට වයස අවුරුදු 30 ක් හෝ ඊට අඩු විය යුතුය.

### 04. නියමයන් හා කොන්දේසි

- මෙම තනතුර බැංකු සේවයේ පොදු නියමයන් හා කොන්දේසිවලට යටත් වන අතර, සාමාන්‍ය බැංකු ධාරාවෙන් පරිබාහිර වේ. (සංවෘත සේවය)
- අයදුම්කරු සුදුසු යැයි හැඟී ගියහොත් වසර දෙකක (02) පරිවාස කාල සීමාවකට පසුව බැංකු සේවයේ ස්ථිර කාර්ය මණ්ඩලයේ පද්ධති විශ්ලේෂක / පරිගණක ක්‍රම සම්පාදක – 1 තනතුරෙහි ස්ථිර කරනු ලැබේ.
- මෙම තනතුරට අදාළ වැටුප් පරිමාණය

  *රු. 62,060/- - රු. 81,660/-*
  *රු. 980/- x 20*

  (විචල්‍ය ජීවන වියදම් දීමනාව ඇතුළු සියලු දීමනා සහිත ආරම්භක දළ වැටුප මසකට රු. 143,000/– ක් පමණ වේ)
- කාර්යාල වේලාවෙන් පසුව සහ සති අන්ත / නිවාඩු දිනවල සේවය කිරීම අපේක්ෂා කෙරේ.

## ජාල / සන්නිවේදන ඉංජිනේරු

### යෝග්‍යතා නිර්ණායක

### 01. සුදුසුකම් හා පළපුරුද්ද

ශ්‍රී ලංකා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන දේශීය හෝ විදේශීය විශ්වවිද්‍යාලයකින් ලබාගත් පරිගණක විද්‍යාව හෝ තොරතුරු තාක්ෂණය හෝ තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය හෝ ඉංජිනේරු විද්‍යාව පිළිබඳ උපාධියක් සමග ජාල සහ විදුලි සංදේශ ක්ෂේත්‍රයේ වසරක පළපුරුද්දක් තිබීම.

හෝ

ශ්‍රී ලංකා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන දේශීය හෝ විදේශීය විශ්වවිද්‍යාලයකින්, පරිගණක විද්‍යාව හෝ තොරතුරු තාක්ෂණය හෝ තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය හෝ ඉංජිනේරු විද්‍යාව පිළිබඳ උපාධියක් සහ CCNA සහතිකය

හෝ

ශ්‍රී ලංකා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන දේශීය හෝ විදේශීය විශ්වවිද්‍යාලයකින් ලබාගත් විද්‍යාවේදී උපාධිය සහ CCNA සහතිකය සමග ජාල සහ විදුලි සංදේශ ක්ෂේත්‍රයෙහි වසරක පළපුරුද්දක් තිබීම.

### 02. වෙනත් සුදුසුකම්

- ස්වයං අභිප්‍රේරිත බව සහ ප්‍රතිඵල කරා දිශාභිමුඛ බව
- අවශ්‍යතාව මත දිවයින පුරා පිහිටි ඕනෑම ලංකා බැංකු ශාඛාවක් විසිත්ත කිරීමේ හැකියාව.

### 03. වයස

අයදුම්පත් භාරගන්නා අවසන් දිනට වයස අවුරුදු 30 ක් හෝ ඊට අඩු විය යුතුය.

### 04. නියමයන් හා කොන්දේසි

- මෙම තනතුර බැංකු සේවයේ පොදු නියමයන් හා කොන්දේසිවලට යටත් වන අතර, සාමාන්‍ය බැංකු ධාරාවෙන් පරිබාහිර වේ. (සංවෘත සේවය)
- අයදුම්කරු සුදුසු යැයි හැඟී ගියහොත් වසර දෙකක (02) පරිවාස කාල සීමාවකට පසුව බැංකු සේවයේ ස්ථිර කාර්ය මණ්ඩලයේ ජාල / සන්නිවේදන ඉංජිනේරු – 1 තනතුරෙහි තහවුරු කරනු ලැබේ.
- මෙම තනතුරට අදාළ වැටුප් පරිමාණය

  *රු. 62,060/- - රු. 81,660/-*
  *රු. 980/- x 20*

  (විචල්‍ය ජීවන වියදම් දීමනාව ඇතුළු සියලු දීමනා සහිත ආරම්භක දළ වැටුප මසකට රු. 143,000/– ක් පමණ වේ)
- කාර්යාල වේලාවෙන් පසුව සහ සති අන්ත / නිවාඩු දිනවල සේවය කිරීම අපේක්ෂා කෙරේ.

## තෝරා ගැනීමේ පටිපාටිය

- තරඟ විභාගයකින් අනතුරුව කෙටි ලැයිස්තුගත කරනු ලබන අයදුම්කරුවන් සඳහා පැවැත්වෙන සම්මුඛ පරීක්ෂණයක් මගින් තෝරාගනු ලැබේ.
- තරඟ විභාගයේදී ලබාගත් ලකුණු, සම්මුඛ පරීක්ෂණය සඳහා අයදුම්කරුවන් කෙටි ලැයිස්තුගත කිරීම සඳහා පමණක් භාවිතා කරනු ලැබේ.

## අයදුම් කිරීමේ පටිපාටිය

අපගේ වෙබ් අඩවිය වන www.boc.lk තුළින් ("Careers" තීරය හරහා) ලබාගත හැකි ආදර්ශ අයදුම්පත් ආකෘතිය අනුව සැකසූ ඔබගේ අයදුම්පත, උප්පැන්න සහතිකය, ජාතික හැඳුනුම්පත, සියලු අධ්‍යාපන සහතික සහ පළපුරුද්ද සනාථ කිරීමේ ලේඛනවල ඡායාස්ථ පිටපත් සමග ලියාපදිංචි තැපැලෙන් 2022.08.13 දින හෝ ඊට පෙර ලැබෙන පරිදි පහත සඳහන් ලිපිනයට යොමු කළ යුතුය. අයදුම්පත් බහා එවන කවරයේ වම් පස ඉහළ කෙළවරේ ඔබ අයදුම් කළ තනතුර සඳහන් කළ යුතුය.

අයදුම්පත් භාරගන්නා අවසන් දිනට ඉහත සඳහන් යෝග්‍යතා නිර්ණායක සපුරා නොමැති හෝ අදාළ ලේඛනවල ඡායාස්ථ පිටපත් ඇතුළත් කර නොමැති හෝ සාවද්‍ය තොරතුරු ඉදිරිපත් කර ඇති හෝ අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට පසුව ලැබෙන අයදුම්පත් කිසිදු දැන්වීමකින් තොරව බඳවා ගැනීමේ පටිපාටියේ ඕනෑම අදියරකදී ප්‍රතික්ෂේප කරනු ලැබේ.

**ප්‍රධාන කළමනාකරු (බඳවා ගැනීම් සහ වෘත්තීය සංවර්ධන),**
**මානව සම්පත් අංශය,**
**26 වන මහල, ප්‍රධාන කාර්යාල ගොඩනැගිල්ල,**
**ලංකා බැංකු චතුරශ්‍රය,**
**අංක 01, ලංකා බැංකු මාවත, කොළඹ 01.**

*ඕනෑම ආකාරයක බලපෑම් කිරීමක් වහාම නුසුදුසුසකු කිරීමට හේතුවේ.*
*තෝරාගනු ලබන අයදුම්කරුවන් පමණක් කැඳවීමේ අයිතිය බැංකුව සතුවේ.*
*සම්පූර්ණ කළ යුතු තනතුරු සංඛ්‍යාව තීරණය කිරීමේ හෝ බඳවා ගැනීම කල් දැමීමේ / අවලංගු කිරීමේ අයිතිය බැංකුව සතුවේ.*

ලංකා බැංකුව BOC ජාතියේ මහා පහන් ටැඹ